**www.wsws.org** ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# මහින්ද රාජපක්ෂ සුලුතර ආන්ඩුවක නායකත්වයට

**Mahinda Rajapakse to head a minority government**

**විජේ ඩයස් විසිනි**
**2004 අප්‍රේල් 07**

ශ්‍රී ලංකාවේ ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග ඊයේ ඇගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ (ශ්‍රීලනිප) ප්‍රධාන පෙලේ සාමාජිකයෙකු වන මහින්ද රාජපක්ෂ රටේ නව අගමැති ලෙස පත් කලා ය. පෙබරවාරි 7දා කුමාරතුංග විසින් ඡන්දයෙන් පත්වුන එක්සත් ජාතික පෙරමුනු ආන්ඩුව පලවාහැරීමට ගනු ලැබූ තීන්දුවෙන් කුලු ගැන්වුන පාලක කවයන් තුල වන කටුක භේදයන් විසඳීමේ ලා රාජපක්ෂව මෙතැනට පත් කිරීමෙන් කිසිවක් නොවිසඳෙනු ඇත.

ආසන 225කින් සමන්විත පාර්ලිමේන්තුගෙ රාජපක්ෂට බහුතරයක් නැත. අප්‍රේල් 2 පැවැත්වූ මැතිවරනයේදී ශ්‍රීලනිප ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) සහ කුඩා පක්ෂ ගනනාවකින් යුක්ත වන එක්සත් ජනතා නිදහස් සන්ධානය (එජනිස) වැඩිම ආසන ප්‍රමානයක් දිනා ගන්නා ලදි. එහෙත් ඔවුනට බහුතරය සඳහා තවත් ආසන 8ක් අවශ්‍ය ය. අනෙක් පක්ෂ සමග තියුනු අතයට ගනු දෙනු සිදුවෙමින් තිබුනේ වුව ද එජනිසට තවමත් අතිරේක සහයක් ලැබී නොමැත. මේ මොහොතේ දී රාජපක්ෂට සුලුතර ආන්ඩුවක නායකයා ලෙස පාලනයේ යෙදීමට සිදුවනු ඇත. මේ වඩාත් දේශපාලන කැලඹිලිකාරීත්වයකට අනිවාර්යයෙන්ම මග පෑදෙන අස්ථාවර තත්වයකි.

හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ අප්‍රේල් 5 පැවැත්වුනු ඔහුගේ පුවත්පත් සාකච්ඡාවේදී පරාජය පිලිගනිමින් මෙසේ අනතුරු ඇඟවීය, “පාර්ලිමේන්තුවේ බහුතරය සහිත ආන්ඩුවක් නොමැතිවිට අන් සියලු දෙයම අවිනිශ්චිතය. සාම ක්‍රියාදාමය වේවා ආර්ථිකය හෝ පරිපාලනය වේවා ඒ සියල්ලම අවිනිශ්චිත වෙයි.” එක්සත් ජාතික පෙරමුන (එජාපෙ) නව ආන්ඩුවට කිසිදු සහන කාලයක් නොදෙන බවද සහාය දෙන්නේ ද නැතහොත් ආන්ඩුව පෙරලා දමන්නේ ද යන්න

“ඒ ඒ කාරනය” අනුව තීන්දු කරන බව ද ඔහු ප්‍රකාශ කලේ ය.

අගමැතිවරයා ලෙස රාජපක්ෂව තෝරාගැනීම සලකුනු කරන්නේ එජනිස සහකරුවන් අතර මෙන් ම ශ්‍රීලනිපය තුලමත් යටින් පවතින භේදයන් පමනි. සිංහල ස්වෝත්තමවාදී ජවිපෙ සමග සහාගයක් වාත්තු කර ගැනීමට කුමාරතුංග ගත්තා වූ තීරනයකට රාජපක්ෂ විසින් නායකත්වය දෙනු ලැබූ ශ්‍රීලනිප කොටස් තදබල ලෙස විරෝධය දැක්වීය. ඔවුන් මනාප වූයේ සාම ක්‍රියාවලිය පෙරට ගෙන යන්නා වූ එජාපෙ සමග වන මහා සන්ධානයකට ය. සභාග එකඟතාවයේ කොටසක් ලෙස, විරුද්ධ පක්ෂ නායක රාජපක්ෂ නොව කුමාරතුංගගේ හිටපු විදේශ ඇමති ලක්ෂ්මන් කදිරගාමර් කවර හෝ එජනිස ආන්ඩුවක අගමැති වන බවට ශ්‍රීලනිප ය එකඟවිය.

ශ්‍රීලනිපයේ රාජපක්ෂ පිල සහ ජවිපෙ සමග ගිවිසුමකට ඇඩි ලෙස තල්ලුව දුන් කුමාරතුංගගේ සොහොයුරා අනුර බන්ඩාරනායක නායකත්වය දුන් පිල අතර කදිරගාමර් සම්මුති කාරකයක් විය. ජවිපෙට ද කදිරගාමර් පිලිගත හැකි විය. මක් නිසා ද යත් ඔහු දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) ත්‍රස්තවාදී සංවිධානයක් ලෙස නම්කර තහනම් කිරීමේ ජාත්‍යන්තර ව්‍යාපාරයකට නායකත්වය දුන්නේ ය. ඒ සමගම කදිරගාමර් සාම සාකච්ඡා පිලිබඳ උපදේශකයෙක් ද වෙයි. එබැවින් ජේවීපීය ආන්ඩුවට එක්වීමෙන් යුද්ධය ඇතිවේ යැයි මහ ව්‍යාපාරිකයන් සහ මහ බලවතුන් තුල වන කනස්සල්ල සංසිඳවීම පිනිස කුමාරතුංගට ඔහු යොදා ගත හැකි ය.

එහෙත් මෙම ගැටලුව මැතිවරනයට පෙර විසඳා නොතිබින. මැතිවරන ව්‍යාපාරය තුල දී තම ඇමතිවරයා කවුරුන්ද යන වග ප්‍රසිද්ධියේ එලි කිරීම එජනිස විසින් ප්‍රතික්ෂේප කරනු ලැබී ය. ඡන්දයෙන් අනතුරුව ද තවදුරටත් පමාවීම් විය. මාධ්‍ය වාර්තා ගනනාවකට අනුව රාජපක්ෂගේ තදබල විරෝධතාවයන් හේතුවෙන් කදිරගාමර් පිලිබඳ අදහසින් පසුබෑමට සඳුදා වන විට කුමාරතුංගට බලකැරින.

ආපසු හැරීම ගලා එන්නේ ශ්‍රීලනිපයේ දුර්වල තත්වය තුලිනි. ශ්‍රීලනිපයට එජාපෙ පරාජය කලහැකි වූයේ ජවිපෙ සමග සන්ධානයක් ඇටවීම නිසාම පමනි. ඡන්ද ප්‍රතිඵල මගින් ඔවුන් කෙරෙහි වූ මහජන අප්‍රසාදය එලිදරවු විය. එජනිස දිනා ගත් ආසන 105න් යම්තමින් 60 ඉක්මවන ආසන ගනනක් දක්වා ශ්‍රීලනිපය පල්ලම් බැසීය. සියල්ලටමත් වඩා එජනිසය සමස්තයක් ලෙස බහුතරයක් ලබාගෙන නැති අතර අනෙක් පක්ෂවල සහාය අයැදීමට බල කැරී තිබේ. සුවිශේෂිතවම බෞද්ධ පූජකයින් අපේක්ෂකයින් ලෙස යොදවාගෙන ආසන 9ක් දිනා ගත් සිංහල අන්තවාදී ජාතික හෙල උරුමයේ (ජාහෙළ) සහාය පැතීමට එයට සිදුව තිබේ.

අඩමාන සහිත දෙපැත්තක් සමතුලනය කිරීමේ රංගනයක් යෙදියහැකි අගමැතිවරයෙකු කුමාරතුංගට අවශ්‍යවිය: එක් අතකින් එල්ටීටීඊය සමග සාකච්ඡා යලි ඇරඹීමේ එජනිස පොරොන්දුව පෙරට ගෙන යාමය. අනෙක්පසින් ඊනියා සාම ක්‍රියාවලියට විරෝධය දක්වන ජාහෙළ පූජකයින් තුටු පහටු කිරීමය. ද්‍රවිඩයකු නිසා කදිරගාමර් ඉබේම වාගේ ජාහෙළයේ ස්වෝත්තමවාදී කැතිගෑමට ගොදුරු වන හෙයින් තමා මේ කටයුත්තට ඔහුට වඩා හොඳින් ගැලපෙන බවට රාජපක්ෂ තර්ක කලේ ය. බෞද්ධ දූරාවලියේ මුදුනත තට්ටු සමග රාජපක්ෂට සමීප සබඳතා ඇති අතර, සාම සාකච්ඡාවලට සහාය දීම සහ නානා ප්‍රකාර දෙමල හා මුස්ලිම් පක්ෂ සමග සබඳතා පවත්වා ගැනීම තුල ඔහුට "ලිබරල්" මතධාරියකු ලෙස ප්‍රසිද්ධියක් ද තිබේ.

රාජපක්ෂ දිවුරුම් දීමෙන් අනතුරුව සිංහල අන්තවාදී දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයට නායකත්වය දෙන භික්ෂුවක් වූ ඇල්ලේ ගුනවංශ නව අගමැතිවරයාව ආගමික ආශිර්වාදයන්ගෙන් නැහැවී ය. එහෙත් රාජපක්ෂ කෝකටත් තෛලය වන්නේ කොපමන කලකටදැයි ඉදිරියේ දී පෙනෙනු ඇත. ඔහු ඔහුගේම පක්ෂය තුල අනුර බන්ඩාරනායක පාර්ශ්වයෙන් ද එජනිස තුල ජවිපෙන් ද එන විරෝධයට මුහුන දෙයි. ප්‍රධානපෙලේ ජවිපෙ නායකයින් ඔහුගේ දිවුරුම් දීම කෙලින්ම මග හැරිය අතර ඔහුගේ කැබිනෙට්ටුවේ තනතුරු භාරගැනීම ප්‍රසිද්ධියේම ප්‍රතික්ෂේප කලේ ඔවුන් වෙනුවට දෙවන පෙල ජවිපෙ මන්ත්‍රීන් පෙරට දමමිනි.

58 වියැති රාජපක්ෂ 1970 සිට දිගටම පාර්ලිමේන්තුව තුල සිටියේ ය. ඉහතදී ඔහුගේ පියා පාර්ලිමේන්තු නියෝජිතයාව සිටි දකුනේ බෙලිඅත්ත ඔහුගේ මැතිවරන කොට්ඨාශයයි. ප්‍රධාන වශයෙන් සිංහලයන් වෙසෙන දකුනේදී ඔහුට සැමවිටම ජවිපෙ සමග කලහ කර ගැනීමට සිදුවිය. කුමාරතුංගගේ මව වන සිරිමා බන්ඩාරනායකගේ, ශ්‍රීලනිප නායකත්වයෙන් යුතු හවුල් ආන්ඩුව විසින් 1971 අප්‍රේල් ජවිපෙ නැගිටීම ලේ විලක ගිල්වා මර්දනය කිරීමට ඔහු සහාය දුන්නේ ය. මෙය ජවිපෙ කිසි දිනෙක අමතක නොකල දෙයකි.

1994 දී ඇගේ පොදු පෙරමුන (පොපෙ) ජයග්‍රහනය කලවිට කුමාරතුංග රාජපක්ෂව කම්කරු ඇමති ධූරයට පත් කලා ය. ඇගේ අරමුන වූයේ කම්කරු පන්තිය සමග ගනුදෙනු කරගැනීමේදී "වාම" පක්ෂ සහ වෘත්තීය සමිති සමග වූ ඔහුගේ සබඳතාවයන් ගසාකෑම ය. එහෙත් රාජපක්ෂගේ අමාත්‍යාංශය වෘත්තීය සමිති සමග එක්ව "කම්කරු ප්‍රඥප්තියක්" කෙටුම්පත් කල විට එය, කම්කරුවන්ගේ රැකියා සහ සේවා කොන්දේසි ආරක්ෂා කරන සියල්ල ඉවත් කරන ලෙස ඉල්ලමින් සිටි ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුවේ තියුනු විරෝධයට ලක්විය. කුමාරතුංග රාජපක්ෂව ධීවර ඇමති දක්වා පහත හෙලූ අතර ඔහු විරෝධයක් නොදක්වා ම එම තීරනය පිලිගත්තේ ය. 2001 දෙසැම්බරයේ පොපෙ පරාජය වීමෙන් පසුව ඔහු පාර්ලිමේන්තුවේ විපක්ෂ නායක හැටියට පත් වූයේ ය.

සාම සාකච්ඡා

නව අගමැතිවරයා හික්මවිය නොහැකි දේශපාලන ගැටලුවලට මුහුන දෙයි. සිය පත්වීමෙන් අනතුරුව රාජපක්ෂ කොලඹ ඉන්දියානු මහ කොමසාරිස් නිරුපම් සෙන් සමග විනාඩි 45ක රහසිගත සාකච්ඡාවක් පැවැත්වී ය. නිල ප්‍රකාශනයක් නිකුත් නොවුන ද කුමාරතුංග සාම ක්‍රියාවලිය අධීක්ෂනය කරනු ඇති බව ද, ඉන්දියාව ඊට මැදිහත් විය යුතු බව ද රාජපක්ෂ වාර්තාකරුවන්ට පැවැසීය. ඔහු මෙසේ පැවසී ය: "හැකි ඉක්මනින් ඉන්දියාවේ මැදිහත්වීම අපට අවශ්‍යය ය. ශ්‍රී ලංකාව තුල ඉන්දියාව භූමිකාවක් ඉටුකිරීම මට සැමවිටම අවශ්‍යවූවකි."

ආන්ඩුව එල්ටීටීඊය සමග සාකච්ඡා ආරම්භ කරන්නේ කෙසේ ද සහ ඉන්දියාවේ කාර්යය කුමක් ද යන්න පවා අපැහැදිලි ය. එජාපෙ ආන්ඩුව පලවා හැරීමට පෙර කුමාරතුංග, ශ්‍රීලනිපය සහ ජවිපෙ ය එල්ටීටීඊයට ප්‍රමානයට වඩා සහන දෙන්නේ යැයි වික්‍රමසිංහව යලියලිත් විවේචනය කලහ. උතුර සහ නැගෙනහිර සඳහා අන්තර්වාර පාලනයක් පිලිබඳ එල්ටීටීඊ යෝජනා නිශ්චිතවම වෙනම රාජ්‍යයක් පිහිටුවීමකැයි කියමින් ඔවුහු ඒවා හෙලා දැක්කාහ. කොලඹ ආන්ඩුවේ කොන්දේසි මත සාකච්ඡා කිරීමට එල්ටීටීඊයට බලපෑම් ඇමීමට ඉන්දියාව යොදා ගැනීම කෙරෙහි කුමාරතුංග සහ රාජපක්ෂ ගනන් බලති.

තමන්ගේ පෙරකලාසි පක්ෂය වන දෙමල ජාතික සන්ධානයට (ටීඑන්ඒ) මන්ත්‍රීන් 22නකු තේරී පත්වීම තම ප්‍රතිපත්ති තහවුරුවීමක් ලෙසට ඔවුන්ගේ පැත්තෙන් එල්ටීටීඊය ප්‍රකාශ කර සිටී. අප්‍රේල් 5 නිකුත්කල ප්‍රකාශයකින් එය මෙසේ තහවුරු කෙරෙයි. "මෙම ප්‍රතිඵලය දෙමල නිජභූමිය පිලිබඳ සංකල්පය, දෙමල ජාතිකත්වය, සහ දෙමල ජනයාගේ මූලික අභිලාසය දෙමල ස්වයංපාලනය බව පිලිගත යුතු බවට පනිවිඩයකි." එය කොලඹ ආන්ඩුවට මෙසේ අනතුරු අඟවයි. "දෙමල ජාතික ප්‍රශ්නය එම පදනම මත දේශපාලනිකව විසඳිය යුතු ය. එය එසේ නොවුනහොත් දෙමල ජනයා ස්වයංනිර්නයේ මූලධර්මය මත සිය නිජභූමියේ දෙමල ස්වාධිපත්‍යය පිහිටුවීමට සටන් කරනු ඇත."

මාර්තු මුල දී එල්ටීටීඊය තුල මතුවුන භේදය සාමසාකච්ඡා යලි ඇරඹීම තවදුරටත් සංකීර්න කර තිබේ. කරුනා නමින් ද හැඳින්වෙන එල්ටීටීඊ යේ නැගෙනහිර මිලිටරි නායක වී මුරලිදරන්ගේ නායකත්වයෙන් කැඩීගිය කන්ඩායමක් ආන්ඩුව සමග වෙනම සටන් විරාමයක් ඉල්ලා සිටී. ටීඑන්ඒ මන්ත්‍රිවරු 5දෙනෙක් කරුනාට හිතවාදීවන බව ප්‍රකට වන අතර ඕනෑම සාකච්ඡාවකදී වෙනම සහභාගිත්වයක් සඳහා බල කිරීමට කරුනා ඒකාන්ත ලෙස ම ඔවුන් යොදා ගනු ඇත.

දිවයින ලාභ ශ්‍රම වේදිකාවක් බවට පරිවර්තනය කිරීමේ මාර්ගය ලෙස වික්‍රමසිංහට සහ සාම ක්‍රියාවලියට

පිටුබලය ලබාදුන් මහ ව්‍යාපාරිකයන්ගේ විරෝධයට ද රාජපක්ෂ මුහුන දී සිටී. එල්ටීටීඊය සමග සාම සාකච්ඡා දුරදිග යන ආර්ථික ප්‍රතිව්‍යුහකරන සැලසුම් සමග ආත්මීයව බැඳී තිබුනි. ආන්ඩුවට එම සැලසුම් හරහා රැකියා, ජීවන කොන්දේසි සේවාවන් සහ සහනාධාර කපා දැමීමේදී පුලුල්ව පැතිරුනු විරෝධතාවක් ජනනය කලේ ය.

එජනිස පෞද්ගලීකරනය නැවැත්වීමේ, වැටුප් ඉහල නැංවීමේ, පොහොර සහනාධාරය යලි ලබා දීමේ සහ තුන්මසක් තුල රැකියා 125,000ක් නිර්මානය කිරීමේ හිස් පොරොන්දු මාලාවක් තුලින් ආන්ඩු විරෝධී මනෝ ගතිය ගසා කැවේ ය. මැතිවරනයෙන් යන්තම් දින කීපයක් ඇතුලතදීම නව ආන්ඩුව මෙම පොරොන්දු ඉටුකර දීමේ පීඩනයට දැනටමත් මුහුන දී සිටියි.

කොලඹ කොටස් වෙලඳපොලේ සියලු කොටස් මිල දර්ශකය අඟහරුවාදා දර්ෂක 127කින් නැතිනම් සියයට 10කින් පමන කඩා වැටුනි. මෙම සතිය තුල දී සියයට 25ක් දක්වා කොටස් වෙලඳ පොල කඩා වැටීමට ඉඩ ඇතැයි සමහර තැරවුකරුවෝ අනතුරු අඟවති.

ලංකා වෙලඳ මන්ඩලය මැතිවරනයෙන් අනතුරුව එජනිස මැතිවරන ප්‍රකාශනයේ ව්‍යාකූල තැන්වලට ඇඟිල්ල දිගු කරමින් ද, "ආර්ථිකය විවෘත සංවෘත හෝ මිශ්‍ර යන කුමක් වුව ද එහි සියලු අංශ සම්බන්ධයෙන් ආර්ථික ප්‍රතිපත්තිය ඉතාම පැහැදිලිව සඳහන් කල යුතු ය" යි ඉල්ලා සිටිමින් ද ප්‍රකාශයක් නිකුත් කලේ ය.

එජනිස ආන්ඩුව එජාපෙ විවෘත වෙලඳ පොල පිලිවෙත් දිගටම ගෙනයායුතුව ඇතැයි ශ්‍රී ලංකා වානිජ හා කාර්මික මන්ඩල සම්මේලනයේ සභාපති නිහාල් අබේසේකර තරයේ කියා සිටියේ ය. ඔහු මෙසේ අනතුරු ඇඟවීය "පිලිගත් පිලිවෙත්වල අඛන්ඩතාවයක් තිබිය යුතු ය. ආර්ථික පිලිවෙත්වල සම්පූර්න වෙනස් කිරීමක් හඳුන්වා දුනහොත් රට මෙම (ඉහල වර්ධන) මට්ටමට ගෙන ඒමට වැය කල අරමුදල් අපතේ යාමකට මග එලි කරනු ඇත."

අප්‍රේල් 4දා *සන්ඩේ ටයිම්ස්* ව්‍යාපාර අතිරේකයේ කතුවැකිය මෙම මනෝභාවයන් ප්‍රතිරාව නැංවූයේ මෙසේ ය. "පෞද්ගලික අංශය සහ ආධාර නියෝජිත ආයතන ශ්‍රම වෙලඳපොල ප්‍රතිසංස්කරන පිලිබඳව තවමත් මුලුමනින්ම තෘප්තිමත් නැති අතර තව දුරටත් වෙලඳපොල නිදහස් කරන ලෙස බල කරති. වියදම් පාලනය කරන ලෙස හා තවදුර වැඩි වැටුප් සඳහා වන ඉල්ලීම්වලට විරුද්ධවන ලෙස ද ආධාර නියෝජන ආයතන ආන්ඩුව මත පීඩනය යොදවති.

දැන් ඉතින් ඡන්දය හමාර හෙයින් තවදුර ආන්ඩුව එවන් කාරනා පිලිබඳව කටයුතු කිරීමේ දී වඩා හොඳ තත්වයක සිටී."

මහ ව්‍යාපාරිකයන්ගේ ඉල්ලීම් සමග රාජපක්ෂ එකට පෙලගැසෙන බවට සැකයක් නැත. කුමාරතුංගගේ කලින් පොපෙ ආන්ඩුව එජාපෙ ප්‍රතිපත්තිවලට මුලුමනින්ම වාගේ සමරූපී ආර්ථික ප්‍රතිපත්ති ක්‍රියාත්මක කලේ ය. සියල්ලටමත් වඩා මැතිවරන ව්‍යාපාරය පවත්වා ගෙන යද්දී ශ්‍රීලනිපයේ සහ ජවිපෙ නායකයන් සංගත නායකයන්ගේ උවමනාවන් සහතික කර දෙන බවට ඔවුන්ට පොරොන්දු දුන්නේ ය. එහෙත් විවෘත වෙලඳපොල විධිවිධාන ක්‍රියාවට නැංවීමේ ඕනෑම ප්‍රයත්නයක්, එජනිස, එජාපෙට වඩා "අඩුනපුර" ය යන වැරදි වැටහීම මත එයට ඡන්දය දුන් කම්කරුවන්ගෙන්, ගොවියන්ගෙන් සහ තරුනයන්ගෙන් ක්ෂනික විරෝධයක් අවුලුවා ලනු ඇත.

රාජපක්ෂ සිය කැබිනෙට්ටුව පිහිටුවීමට පවා පෙරාතුවම ඔහු, ඉක්මනින්ම, නව දේශපාලන අර්බුදයකට මග විවර කිරීමට ඉඩ සැලසෙන තත්වයකට මුහුන දී සිටියි.

© www.wsws.org